# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2079/31 – 2018 ජූලි 10 වැනි අඟහරුවාදා – 2018.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1999 නොවැම්බර් මස 17 වැනි දින අංක 1106/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1999 අංක 249 දරන ආඥාවේ කැබලි අක්ෂර 'ඒ' ලෙස සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩමේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: එල්/03ජේ/94/ඩී/107.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: බල4/2/46.
2018 ජූනි මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 17ඒ, කොස්ගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කොස්ගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක ගා 3943 හා 2011.12.30 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක 02 – අතුවල ඉඩමේ උතුරු කොටස, පුංචි ලියද්ද නොහොත් පොඩි සනිගේ කොටුව සහ අත්තනවලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0195ක් පමණ**

උතුරට: මාර්ගය සහ ඩී. ඒ. පෙරේරා හිමිකම් කියන අත්තනවල ඉඩම; නැගෙනහිරට: ඩී. ඒ. පෙරේරා හිමිකම් කියන අත්තනවල ඉඩම සහ තිරමාදුර මියුරින් මෙන්ඩිස් සහ තවත් අය හිමිකම් කියන ලන්තුවාහන්දි එලාරිස්ට අයිති අත්තනවල ඉඩම; දකුණට: තිරමාදුර මියුරින් මෙන්ඩිස් සහ තවත් අය හිමිකම් කියන ලන්තුවාහන්දි එලාරිස්ට අයිති අත්තනවල ඉඩම සහ ඩී. ඒ. පෙරේරා හිමිකම් කියන තම්බිතොට පදිංචි වත්ත; බටහිරට: ඩී. ඒ. පෙරේරා හිමිකම් කියන තම්බිතොට පදිංචි වත්ත සහ මාර්ගය.

07 - 816

1A – G28040 – 17 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*